ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි පාඨමාලාව

3 වන මට්ටම - 2004/2005

අවසාන පරීක්ෂණය - 2005

# MCU 1204 - සංවිධාන පිළිබඳ සමාජ මනෝවිද්‍යාව

කාලය පැය තුනයි.

---

දිනය 2006.02.11 වේලාව - පෙ.ව. 09.30 - ප.ව 12.30

---

**උපදෙස් - ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

01. (අ) " සංවිධාන මනෝවිද්‍යාව" යන පදයෙන් ඔබ වටහා ගන්නේ කුමක් ද? සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 05

(ආ) සංවිධාන මනෝවිද්‍යාවේ මූල්‍යයන් විස්තර කරන්න.

(ලකුණු 10

(ඇ) සංවිධාන මනෝවිද්‍යාවෙහි ප්‍රධාන ව්‍යවහාරික පැතිකඩයන් විස්තර කරන්න.

(ලකුණු 10

02. "දක්ෂතා සහ කුසලතා ආයතනයක බඳවා ගැනීමේ ක්‍රියාවලියෙහි වැදගත් අවශ්‍යතාවයන් දෙකක් වේ. එක් එක් කාර්යයන් සඳහා අදාළවන වගකීම් පැවරීම උදෙසා, මානව සම්පත් තෝරා ගැනීමට පෙර එකී කාර්යය සඳහා අවශ්‍ය වන දක්ෂතා, කුසලතා අධ්‍යාපනය සහ පසුබිම තීරණය කිරීමට සිදුවේ."

ඉහත ප්‍රකාශය ආශ්‍රයෙන් "මානව හැකියාවන්" යනු මොනවාදැයි පැහැදිලි කොට, මානව හැකියාවක ලක්ෂණ කිහිපයක් විස්තර කරන්න.

(ලකුණු 25

03. (අ) කණ්ඩායම් "සමාජානුයෝජනය" යන පදයෙන් එබ වටහා ගන්නේ කුමක් ද? සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 0

(ආ) කණ්ඩායම් සමාජානුයෝජනයෙහි ප්‍රධාන පියවරයන් හඳුන්වා එකිනෙක විස්තර කරන්න.

(ලකුණු 20

04. "සංවිධානයක අරමුණු ලඟාකර ගැනීමේදී කණ්ඩායම් සහයෝගීතාවය ආධාරකයක් මෙන්ම බාධකයක් ද විය හැක."

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න. ඔබේ පිළිතුර ප්‍රායෝගික උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 2

05. පුද්ගලයන් ද ඇතුළුව යමෙකුගේ පරිසරයේ ඇති ඕනෑම සංසිද්ධියක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන අයුරු තීරණය කරන, පූර්ව තීරකයක් වශයෙන් "ආකල්පය" යන්න නිර්වචනය කළ හැක. මෙනයින් වැඩ සංවිධාන තුළ කළමනාකරුවන්ට බොහෝ අවස්ථාවලදී ආයතනයේ අරමුණු හා සැසඳෙන පරිදි සේවක ආකල්ප වෙනස් කිරීමට /වෙනස් කිරීමට උත්සාහ ගැනීමට සිදුවේ. කෙසේ නමුත් මෙය පහසු කාර්යයක් නොවේ.

(අ) ඉහත ප්‍රකාශය ආශ්‍රයෙන් ඔබ දන්නා ඕනෑම ආකල්ප වෙනස් කිරීමේ ක්‍රම තුනක් හඳුන්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(ආ) ආකල්ප වෙනස් කිරීමට ඇති බාධක මොනවා ද?

(ලකුණු 10)

06. පුද්ගලයෙකුගේ මානසික තත්වය සහ හැඟීම් ද ඔහු හෝ ඇය යම් විශේෂිත තත්වයක් සංජානනය කළ හැකි ආකාරය ද අතර ඇති සම්බන්ධය පිළිබඳ අවබෝධය කළමනාකරණ තීරණ ගැනීමේදී දැඩි ප්‍රායෝගික අදාළත්වයකින් යුතු වේ.

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. උදාහරණ ආශ්‍රයෙන් ඔබේ පිළිතුර විදහා දක්වන්න.

(ලකුණු 25)

07. "පුද්ගල පෞරුෂත්වය අවස්ථානුකූල තත්ත්වයන්ගේ බලපෑමට ලක්වන බැවින් පෞරුෂත්ව තීරකයන් ලෙස ආවේණික සහ පාරිසරික තත්ත්වයන් විශ්ලේෂණය කිරීම ඵල රහිත ක්‍රියාවක් බවට තර්ක කළ හැක."

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? එසේ වන්නේ හෝ නොවන්නේ ඇයි ? උචිත න්‍යායාත්මක තර්කයක් ආශ්‍රයෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 25)

08. සංවිධානයක ඵලදායීතාවය, සංස්කෘතිය සහ එහි සේවකයන්ගේ දිගුකාලීන අභිවෘද්ධිය වැඩි දියුණු කිරීම උදෙසා, මානුෂික අගයන් මත ගොඩ නගා ඇති සැලසුම්ගත වෙනස් කිරීමේ මැදිහත් වීම් සමූහයක් ඒකරාශී කොට දැක්වීම සඳහා සංවිධාන සංවර්ධනය යන පදය භාවිතා වේ.

(අ) සංවිධාන සංවර්ධනයෙහි ප්‍රධාන පැතිකඩයන් මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) සංවිධාන සංවර්ධන මැදිහත් වීමේ උපාය මාර්ගයන් හඳුන්වා එකිනෙක සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

- හිමිකම් ඇවිරිණි. -